## කහවත්ත ප්‍රාදේශීය සභාව

## රත්නපුර දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 26 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 පෙබරවාරි 27 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 මැයි 23 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය.
----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කහවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරණු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා පොදු වෙළඳපලට විදුලිය සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා දරණ ලද ප්‍රාග්ධන වියදම වූ රු. 376,737 ක් විදුලි බිල්පත් පියවීම අයභාර වියදමට ගලපා තිබීම හේතුවෙන් මෙහෙයුම් අතිරික්තය උක්ත වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබී තිබූ රු. 160,510 ක වරිපනම් බදු ඉකුත් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ප්‍රධාන ලෙජරය සහ ලේඛණ අතර ශේෂ සමාන කිරීම සඳහා ජ'නල් සටහන් අංක 13 මගින් ජල ගාස්තු ගිණුම හා කඩකුලී ගිණුමට පිළිවෙලින් රු. 11,611 ක් හා රු. 77,615 ක් වශයෙන් ලේඛණය හා ගිණුම අතර වන වෙනස්කම් හඳුනාගැනීමකින් තොරව ගැලපීම් කර තිබුණි.

(ඈ) සභාව විසින් මහජන බැංකුවේ හා ලංකා බැංකුවේ පවත්වා ගෙනයන බැංකු ගිණුම් 02 කට අදාලව පිළියෙල කරන ලද බැංකු සැසඳුම් වෙනවෙනම සැලකූ කල රු. 143,957 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
-----------------------------

ගිණුම් විෂයයන් 03 කට අදාලව සමාලෝචිත වර්ෂයේ ආදායම්, මූල්‍ය ප්‍රකාශන අනුව සහ උපයෝගී ලේඛණ අනුව රු. 1,506,224 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

රු. 92,564,931 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් වල අගය සැදුම්ලත් ආකාරය දැක්වෙන විස්තරාත්මක උප ලේඛණ විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

1.3.4 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

----------------------------------------------------

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) | මුදල් රෙගුලාසි 101 සිට 110 දක්වා | 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය සතුව තිබූ අංක 46–4075 දරන ට්‍රේලරයෙහි ඌනතාවය සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව ගතයුතු කිසිඳු පියවරක් විගණිත දිනය වූ 2015 නොවැම්බර් 13 දින වනවිටත් ගෙන නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි 371(2) | 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු. 126,149 ක්වූ අත්තිකාරම් විගණිත දිනය වූ 2015 නොවැම්බර් 13 දින වනවිටත් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (III) | මුදල් රෙගුලාසි 371(2)ආ | තත්කාර්යය අතුරු අග්‍රිමයක් එක් අවස්ථාවකදී රු. 20,000 ට නොවැඩි විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාලව එම වටිනාකම ඉක්මවා අවස්ථා 02 කදී රු. 87,500 ක අත්තිකාරම් ලබා දුන් අවස්ථා නිරීක්ෂණය විය. |
| (IV) | මුදල් රෙගුලාසි 571 | ඉකුත් වූ තැන්පතු නියාදනය කල යුතු වුවත්, 2000 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා එකතුව රු. 851,970 ක් වටිනාකමැති තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ2012 මැයි 29 දිනැති අංක 03/2012 දරන චක්‍රලේඛය | |
| | 06 වන වගන්තිය | මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන දීමනා ගෙවීමේදී පළමුව අත්තිකාරම් ලබා දී පසුව එය ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත ගෙවිය යුතු වුවත්, ඉදිරිපත් කරනු ලබන බිල්පත් වලට හෝ බිල්පත් ඉදිරිපත් කිරීමකින් තොරව සභා වාරයන්ට පැමිණි දිනයන් සඳහා මන්ත්‍රී දීමනාවට ඉන්ධන දීමනාවද එකතු කර ගෙවීම් සිදුකර තිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 2,277,750 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 3,005,085 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 727,335 කින් අඩුවී තිබූ අතර, එය සියයට 24 ක අඩුවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් වල වැඩිවීම හා පුනරාවර්තන ආදායම් වල අඩුවීමයි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 3,352 | 3,302 | 3,213 |
| බදු කුලී | 7,766 | 3,021 | 617 |
| බලපත්‍ර ගාස්තු | 194 | 118 | - |
| වෙනත් ආදායම් | 34,749 | 31,034 | 9,663 |

#### 2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, බදු කුලී ආදායම්, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් පිළිවෙලින් සියයට 19 සිට සියයට 64 ක් වශයෙන් විශාල ලෙස අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

(ආ) 2013, 2014 හා 2015 වර්ෂයන්හි මුළු ඇස්තමේන්තුගත ආදායම හා මුළු රැස්කල ආදායම සැසඳීමේදී පිළිවෙලින් සියයට 0.94 ක්, සියයට 0.27 ක් හා සියයට 48 ක් වශයෙන් අඩුවීමක් පෙන්නුම් කර තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී රැස්කල ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 48 ක විශාල අඩුවීමක් පෙන්නුම් කර තිබුණි.

2.3.3 වරිපනම් බදු
--------------

විගණිත දිනය වූ 2015 නොවැම්බර් 11 දිනට සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු රැස්කිරීමේ කාර්යය සාධනය හිඟයෙන් සියයට 26 ක් හා අයවැයගත අගයෙන් සියයට 37 ක් වශයෙන් ඉතා අඩු මට්ටමක පැවතිණි.

2.3.4 බලපත්‍ර ගාස්තු
----------------

සභා බල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර ව්‍යාපාර වර්ග අනුව හා කර්මාන්ත අනුව ලේඛණයක් සැකසීමකින් තොරව එදිනෙදා අය කරනු ලබන උක්ත බදු පමණක් ලේඛණගත කිරීම සිදු කර තිබුණි.

2.3.5 වෙනත් ආදායම්
-------------------

(අ) දැන්වීම් පුවරු සඳහා අය කරන ගාස්තු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගැසට් නිවේදනයක් මඟින් ප්‍රසිද්ධියට පත්කර නොමැති අතර, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වන ස්ථිර හා තාවකාලික දැන්වීම් පුවරු මඟින් ලැබිය හැකි වූ විශාල ආදායමක් මඟහැරී ගොස් තිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ2009 මාර්තු 09 දිනැති අංක 2009/01දරණ චක්‍රලේඛ විධිවිධාන අනුව පොදු වෙළඳපල කඩකාමර බදු කුලිය වෙන්වෙන්ව ප්‍රධාන තක්සේරුකරු මඟින් තක්සේරු කරගත යුතු වුවත්, ඊට පටහැනිව ප්‍රාදේශීය සභා පොදු වෙළඳපල කඩකාමර සඳහා Key Money (පෙර මුදල් ගෙවීමේ ක්‍රමය) ලෙස ඉහල මාලයේ කඩකාමරයක් සඳහා රු. 400,000 ක්ද, පහල මාලයේ කඩකාමරයක් සඳහා රු. 500,000 ක්ද වශයෙන් 2013 අගෝස්තු 29 දින මහා සභාව මඟින් තීරණය කර තිබූ අතර, විගණිත දිනය වූ 2015 නොවැම්බර් 11 දින වනවිටත් එලෙස ලබාදුන් කඩකාමර 06 කට අදාලවද රු. 2,065,000 ක් පෙර ගෙවුම් මුදල් හිඟව පැවතුණි.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------

2015 පෙබරවාරි මාසයෙන් පසු උසාවි දඩ ආදායම් හා 2014 අගෝස්තු මාසයෙන් පසු රත්නපුර දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් මුද්දර ගාස්තු මෙන්ම 2015 මාර්තු මාසයෙන් පසු ඇඹිලිපිටිය දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් මුද්දර ගාස්තු ආදායම් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණයගිමියන්ට මුදල් නොගෙවීම හෝ ලේඛණ නඩත්තු නොවීම මත පසුගිය වර්ෂයන්ට අදාලව රු. 11,009,360 ක ණයහිමි ශේෂයක් නිරීක්ෂණය වූ අතර, ණය පියවීමට හෝ ලේඛණ නිවැරදි කර ගැනීමට විගණිත දිනය වූ 2015 නොවැම්බර් 11 දින වනවිටද කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතුව වාහන 13 ක සංචිතයක් සඳහා සභාව සතුව රියදුරන් 04 දෙනෙකු පමණක් සිටින අතර, ඒ හේතුවෙන් වාහන කිහිපයක වගකීම් එක් නිලධාරියෙකුට පැවරීමට සිදු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.2 මතබේදයට තුඩුදුන් ගනුදෙනු

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකරණ භාරයට ගෙන තිබූ ප්‍රාදේශීය සභා සභාපතිවරයා විසින් භාවිතා කරන ලද ලියාපදිංචි අංක පීඑෆ්-5499 දරන කැබ් රථය මුදා ගැනීම සඳහා 2015 පෙබරවාරි 09 දින රු. 10,000 ක මුදලක් ගෙවා තිබූ නමුත් එම ගෙවීම් සභාපතිවරයාගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් 2014 මැයි 11 දින ලැබී තිබූ 4 WD Diesel NISSAN NAVARA LE අංක පීඊ-5499 දරන ඩබල් කැබ් රථය 2014 ඔක්තෝබර් 02 දින හා 2015 ජූලි 27 දින අනතුරට පත්වී ඇතත්, ඒ සම්බන්ධ කිසිදු ලියවිල්ලක් විගණනයට යොමුකර නොතිබුණි. තවද, 2015 අගෝස්තු 08 දින අධිකරණ ක්‍රියාමාර්ගයක් සඳහා පොලිස් අත් අඩංගුවටද ගෙන තිබුණි. 2014 මැයි 11 දින සභාවට ලැබී තිබූ රුපියල් මිලියන පහකට අධික වටිනාකමින් යුත් උක්ත රථය වසර 1 ½ ක කාලයකදී අපරීක්ෂාකාරී ධාවනය හා නොසැලකිල්ල මත සභා අරමුදලට අනවශ්‍ය වැය බරක් වී තිබුණි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

කසල කළමනාකරණය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදීද නිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, නගරයේ එකතු වන කසල හවුපෙවත්ත ප්‍රදේශයේ විවෘත භූමියක වලවල් කපා දිරන හා නොදිරන කසල සියල්ල වල දැමීම වර්තමානය වන විටද ක්‍රියාත්මක කරන බව නිරීක්ෂණය විය. කසල බැහැර කිරීම සඳහා වලවල් කැපීමට බැකෝ යන්ත්‍රය වෙනුවෙන් රු. 101,890 ක් වැයකර තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

මධ්‍යම පරිසර අධිකාරිය මගින් ලැබී ඇති WP LL–6964 දරන ෆෝටෝන් ඩම්ප් ට්‍රක් රථය වර්තමානය වනවිට සභා භූමියේ නිශ්කාර්යයව ගාල් කර තබා ඇති අතර, නිශ්චිත රියදුරෙකු හෝ නොමැතිව අධික

ලෙස රක්ෂණ හා අනෙකුත් වියදම් දරමින් පැවතුණි. රථය සභාවේ අවශ්‍යතාවය ඉක්මවා ගිය විශාල ප්‍රමාණයේ එකක් වීම සහ කසල ප්‍රවාහනය සඳහා හෝ වෙනත් යම් කටයුත්තක් සඳහා යෙදවීමේ හැකියාවක් නොමැති බවද, ආදායම් උත්පාදිත අවස්ථාවක් සඳහා යෙදවීමක් හෝ සිදු නොකර විගණිත දිනය වූ 2015 නොවැම්බර් 13 දින වනවිටද නිෂ්කාර්යයව පැවතුණි.

(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම
--------------------------------------------------------------

(I) සභා බල ප්‍රදේශය තුල සභාව සතු අක්කර 22 රූඩ් 03 පර්චස් 31 ක සුසාන භූමි 25 ක් පවතින බව හඳුනාගෙන ඇතත් එම සුසාන භූමි සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු මෙන්ම අදාල පිඹුරුපත් සභාව සතුව නොතිබුණි. උක්ත සුසාන භූමි අතරින් සුසාන භූමි 02 ක් සඳහා මිනුම් ගාස්තු ලෙස රු. 34,520 ක් ගෙවා ඇතත් මිනුම් කටයුතු අවසන් කර සුසාන භූමි සභාවට පවරා ගැනීමේ කටයුතු සිදුකර නොතිබුණි.

(II) සභාව සතු ක්‍රීඩාපිටි 21 ක් පවතින අතර, ලේඛණගතව පැවතියේ ක්‍රීඩාපිටි 02 ක් පමණි. තවද, පෙර පාසලක් සභාව සතු ඉඩමක පවත්වාගෙන යනු ලැබුවද ඉඩමේ අයිතිය සම්බන්ධයෙන්ද උක්ත ක්‍රීඩාපිටි සම්බන්ධයෙන්ද හිමිකම් ඔප්පු මෙන්ම අදාල පිඹුරුපත් සභාව සතුව නොවීය.

04. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය
----------------------------------------

4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම
----------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

05. පද්ධති හා පාලනය
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) සන අපද්‍රව්‍ය කළමනාකරණය